**IPRC/16/61**

# බෞද්ධ චතුෂ්කෝටික හා අමරාවික්ඛේපවාදීන්ගේ පංචකෝටික තර්ක ක්‍රම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

දිල්ශාන් මනෝජ් රාජපක්ෂ[1*]

සංශයවාදය යන්න සඳහා සංදේහවාදය යන්න ප්‍රධානත ම පර්යායක් වන අතර පාලි සාහිත්‍යයට අනුව භාරතීයයන් මේ සඳහා ව්‍යවහාර කර ඇත්තේ අමරාවික්ඛේපවාදය යන පදය යි. අමරාවික්ඛේපවාදය පිළිබඳ කරුණු අන්තර්ගත මූලික ම පාලි මූලාශ්‍රය වනුයේ දීඝනිකායේ එන සාමඤ්ඤඵල සූත්‍රය හා බ්‍රහ්මජාල සූත්‍රය මෙන් ම එම සූත්‍රවල අටුවා ය. මෙහිදී මූලික අවධානය යොමු කෙරෙන්නේ පෙළෙහි අමරාවික්ඛේපවාදීන්ගේ පංචකෝටික නය හා බෞද්ධ චතුෂ්කෝටික තර්ක ක්‍රම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම කෙරේ ය. දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයට අනුව අමරාවික්ඛේපවාදය නමින් හැඳින්වූ ගුරුකුල සතරක් පැවතුණු අතර ෂඩ් ශාස්තෘන් අතරින් සංශයවාදී චින්තනය මෙහෙය වූ සංජය බෙල්ලට්ඨිපුත්තයන් වනාහි ඉහත කී  ස්වකීයිය අඥානභාවය පදනම් කරගෙන සංශයවාදය මෙහෙය වන ලද ගුරුකුලයේ නායකයා නැතහොත් සාමාජිකයෙක් විය යුතු ය. සත්‍යෙක්ෂණය කළ නොහැකි මරණින් මතු පැවැත්ම ආදී අධිභෞතික කරුණු හා හොඳ, නරක ආදී ආචාර විද්‍යාත්මක කරුණු කෙරේ ඔහුගේ අවධානය යොමු වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පංචකෝටික නය හෙවත් පංචකෝටික තර්ක ක්‍රමයක් භාවිත වූ බව පෙනේ. දීඝනිකාය අටුවාවට අනුව මෙම පංච භංගි නයෙහි එක් එක් ප්‍රස්තුත කෙරෙන් අපේක්ෂා කරන ලද අරමුණු ද වේ. කිසිසේත් සත්‍යෙක්ෂණ කළ නොහැකි හෝ සත්‍යෙක්ෂණය කළ හැකි නමුත්, එසේ කිරීමෙන් ඵලක් නැති හෝ සත්‍යෙක්ෂණය කළ හැකි නමුත්, තවමත් සිදු නො කළ යමක් පිළිබඳ විය හැකි යැයි සැලකිය හැකි මෙම භව්‍යතා සංජය මෙන් ම අනෙක් සංශයවාදී ගුරුකුල තුන ද පංචභංගී නය භාවිත කර ඇත්තේ තමන් කිසිදු ආකාරයක අන්තවාදයක් නොදරන බව ප්‍රකට කිරීමට බව පෙනේ.

අමරාවික්ඛේපවාදීන්ගේ පංචභංගී නයෙන් බෞද්ධ චතුෂ්කෝටියේ විශේෂත්වය වන්නේ ප්‍රස්තුත සතර අතරින් සැමවිට ම එකක් පමණක් සත්‍ය වන බව පෙන්වා දීමෙනි. ප්‍රස්තුත සතර ප්‍රතික්ෂේප කරනුයේ අධිභෞතික යැ'යි සැලකෙන විෂය සම්බන්ධයෙන් පමණි. බුදුදහම චතුෂ්කෝටික නය හුදෙක් භාෂා මෙවලමක් ලෙස සලකා ඇත්තේ උපයෝගිතා පදනමකින් නිසා පරිපූර්ණ සත්‍ය ප්‍රකාශක වාහකයක් ලෙස එය උපයුක්ත කර ගැනීම සම්බන්ධයෙන් සඳහනක් කිසිදු තැනක දක්නට නොමැත. මෙහි දී අපගේ මෙම කාර්යයට චතුෂ්කෝටික තර්ක ක්‍රමය සැලකිල්ලට භාජනය වනුයේ මෙමගින් බුදුදහම සාරවාදය *(Essentialism)* හා ඒකාන්තවාදය *(Abosolutism)* ප්‍රතික්ෂේප කරන බැවින් එම සංකල්ප මත පදනම් ව ඇති සත්‍ය හා අසත්‍ය යන ද්වාවිධකරණයන් යුතු තර්ක ක්‍රමය ද බැහැර කරන අකාරය පෙනී යන නිස යි. අන්තවාදයකට නොවැටී, අන්තවාදවල නොගැටී දාර්ශනික මධ්‍යස්ථතාව පිළිබිඹු කිරීම අතින් බෞද්ධ චතුෂ්කෝටිකය හා අමරාවික්ඛේපවාදීන්ගේ මෙම පංචකෝටික නය සමානත්වයක් පිළිඹිබු කරන අතර එම අගය සදාචාරාත්මක වශයෙන් ද ඇගයීමට ලක් කරන විට බෞද්ධ චතුෂ්කෝටික පදනම තවදුරටත් විශේෂ වන්නේ එයින් ගැඹුරු ආධ්‍යාත්මික පදනමක් ද අවධාරණය වන බැවිනි.

***ප්‍රමුඛ පද:*** *සංශයවාදය, අමරාවික්ඛේපවාදය, ඥාන විභාගය, පංචභංගී නය හෙවත් පංචකෝටික නය, තර්කණ ක්‍රම*

[1] කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව *****dilshanmanojrajapaksha@gmail.com